**සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම - 2014**

---

සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනමේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 19 දරන සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම පනතේ 11(2) වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර පදනමේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලැසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මත සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස පදනමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පදනමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

**මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.**

**2. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

**---------------------------------**

**මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**-----------------------------------------**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

**------------------------------------------**

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01**

**-----------------------------------------------**

**පූර්ව වර්ෂ ගැලපීම් ලෙස ගිණුම්වල දක්වා ඇති වටිනාකම රු. 11,653,854 ක් සම්බන්ධයෙන් වූ තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද සටහන්වලින් හෙලිදරව් කර නොතිබුණි.**

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

**-----------------------------------------------**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

**(i) ප්‍රමිතයේ ඡේද අංක 47 පරිදි දේපළ පිරියත හා උපකරණ සෑම වර්ෂ තුනකට හෝ පහකට වරක් ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය ආරම්භයට ස්ථාවර වත්කම් ගිණුමෙහි දැක්වෙන පිරිවැය රු. 537,130,291 ක් වූ වත්කම් සම්බන්ධයෙන් එම විධිවිධානවලට අනුව කටයුතු කර නොතිබුණි.**

**(ii) 2005 වර්ෂයේ දී පදනමට පවරා දී තිබුණු වටිනාකම රු. 272,000,000 ක් වූ ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම වෙන වෙනම හඳුනාගැනීමකින් තොරව මුළු වටිනාකමින් සියයට 50 ක් ගොඩනැගිලි වටිනාකම ලෙස සළකා ක්ෂය කර තිබුණි.**

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

**----------------------**

**අන්තර්ජාල සේවා සමාගමක් විසින් ප්‍රජාශක්ති මධ්‍යස්ථානවල 2009 දෙසැම්බර් 16 දින සිට 2013 නොවැම්බර් 01 දින දක්වා V-SAT ඇන්ටනා නඩත්තු සේවා අවස්ථා 120 කින් 96 ක් සඳහා රු.7,008,000 ක් හා 2013 දෙසැම්බර් 01 සිට 2014 පෙබරවාරි 28 දක්වා වූ මාස 03 සඳහා රු.1,600,000 ක අන්තර්ජාල සේවා ගාස්තු ද අතුලත්ව ගෙවිය යුතු එකතුව රු.8,608,000 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි.**

**2.2.3** **පැහැදිලි නොකළ වෙනස්කම්**

**--------------------------------**

**සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2014 හා ඊට පෙර වර්ෂවලට අදාලව රේඛීය අමාත්‍යාංශයෙන් පුනරාවර්තන වියදම් සඳහා රු.4,261,841ක මුදලක් පදනම වෙත ප්‍රතිපූරණය කළ යුතු ලෙස දක්වා තිබුණ ද රේඛීය අමාත්‍යාංශයේ වාර්තා අනුව පදනමට එවැනි ප්‍රතිපූරණය කළයුතු මුදලක් නොමැති බව නිරීක්ෂණය විය.**

**2.2.4** **විගණනය සඳහා සාක්ෂි නොවීම**

**-----------------------------------**

**පදනමට ලැබිය යුතු එකතුව රු.8,572,886 ක මුදලක් හා පදනමෙන් ගෙවිය යුතු එකතුව රු.8,937,243 ක ගිණුම් ශේෂ සම්බන්ධයෙන් කාල විශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.**

**2.3** **ලැබිය යුතු හා ගෙවියයුතු ගිණුම්**

**-----------------------------------**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

**(අ)** **සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවෙන් භාණ්ඩ ලැබී මාසයක් ඇතුලත මුදල් පියවීමේ පදනම මත 2014 වර්ෂය තුල දී මිල දී ගත් භාණ්ඩ හා උපකරණ වෙනුවෙන් ගෙවිය යුතු රු. 78,397,494 ක් 2016 වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි.**

**(ආ)** **2012 වර්ෂයේ පැවැත්වූ දැයට කිරුළ උත්සවය වෙනුවෙන් ඉදිකරන ලද වෙළඳ කුටි සඳහා පෞද්ගලික ආයතනයක් වෙත ගෙවිය යුතු රු.282,567 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද නිරවුල් කර නොතිබුණි.**

**(ඇ)** **දීර්ඝ කාලයක් තිස්සේ ඉදිරියට ගෙන එමින් පවතින එකතුව රු. 12,627,270 ක් වූ අත්තිකාරම් හා ණයගැති ශේෂ සහ එකතුව රු. 5,356,146 ක් වූ ණයහිමි ශේෂ අයකර ගැනීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.**

**(ඈ)** **2012 නොවැම්බර් 07 දින පවත්වන ලද පොදු ව්‍යාපාර සඳහා වූ කාරක සභාවේ නියෝගයකට අනුව පදනම විසින් ලංකා කම්කරු කොංග්‍රසයේ ගොඩනැගිල්ලක් වෙනුවෙන් කරන ලද ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට අයකර ගතයුතු රු.773,172 ක මුදල 2016 වර්ෂය අවසාන වන විටත් අයකර ගෙන නොතිබුණි.**

**(ඉ)** **2013 වර්ෂය හා ඊට පෙර වර්ෂවලට සහ සමාලෝචිත වර්ෂයට අදාලව රේඛීය අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කළ යුතු පිළිවෙලින් රු.6,813,624 ක් හා රු.49,161,510 ක් වූ ලැබිය යුතු ශේෂ 2016 වර්ෂය අවසානය දක්වාම ප්‍රතිපූර්ණය කර නොතිබුණි. එහෙත් පදනම ඒ පිළිබඳව කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.**

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1998 දෙසැම්බර් 31 දරන සේවක අර්ථසාධක අරමුදල් සංශෝධිත පනතේ II කොටසේ 10 (1) හා (2) ඡේද | 2012 සැප්තැම්බර් සිට 2013 මාර්තු දක්වා එකතුව රු.4,205,282 ක් වූ සේවකයින්ගේ හා සේව්‍යයාගේ අර්ථසාධක අරමුදල් දායකය සේවක අර්ථසාධක අරමුදල වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ආ) | 2005 අංක 19 දරන සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම පනතේ 10 වගන්තියේ 2, 3 හා 4 ඡේද | ස්වකීය බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී දරන සියලු වියදම් පදනම ගොඩ නගා ගත් අරමුදලින් දැරිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුල පදනම උපයා තිබුණේ රු.මිලියන 3.86 ක් වූ අතර ඉතිරි සියලු වියදම් සඳහා අවශ්‍ය අරමුදල් රේඛීය අමාත්‍යාංශය හරහා රජය විසින් ලබා දී තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 371 | අදාල කාර්යය නිමකළ විගස ලබා ගත් අත්තිකාරම් නිරවුල් කළ යුතු වුවද, ප්‍රජා ශක්ති ව්‍යාපෘතියේ කළමනාකරුට 2011 සහ 2013 වර්ෂවල ලබා දී තිබුණු පිළිවෙලින් රු.318,867 ක් සහ රු.118,071 ක් වූ අත්තිකාරම් 2014 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 757 | පදනමේ සියලු අංශ ආවරණය වන පරිදි සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 139(1) | සෑම ගෙවීම් වවුචරයක්ම සහතික කිරීම සඳහා බලයදී ඇති නිලධාරියකු විසින් සහතික කරනු ලැබිය යුතු වුවද සිදු කරන ලද නියැදි පරීක්ෂාවේ දී එකතු වටිනාකම රු.157,516 ක් වූ වවුචර් 06 ක් සඳහා සහතික කිරීමකින් තොරව ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 ඡේදය | 2009 සැප්තැම්බර් සිට 2014 මාර්තු දක්වා ගිවිසුමකින් තොරව V-SAT ඇන්ටනා නඩත්තු සේවාව ලබා ගෙන එම කාලපරිච්ඡේදය තුල රු.51,099,464 ක මුදලක් පෞද්ගලික සේවා ආයතනයකට ගෙවා තිබුණි. කෙසේ වුවද අදාල සේවා ආයතනය විසින් 2009 අගෝස්තු 14 දින ගිවිසුමේ කෙටුම්පතක් පදනම වෙත ඉදිරිපත්කර තිබුණ ද පදනම හා අදාල රේඛීය අමාත්‍යාංශය ඒ පිළිබඳ කිසිදු සැලකිල්ලක් නොදක්වා අඛණ්ඩව අදාල සේවා කටයුතු කරගෙන ඒ වෙනුවෙන් ගෙවීම් කර තිබුණි. |

3 . මූල්‍ය සමාලෝචනය
---------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ පදනමේ මූල්‍ය ප්‍රතිඵලය රු.48,715,500 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.50,661,764 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි ඌනතාවය රු.1,946,264 කින් අඩු වී තිබුණි. ප්‍රජාශක්ති ව්‍යාපෘතියෙහි පරිත්‍යාග රු. 43,997,693 කින් සහ ප්‍රචාරණ හා ප්‍රවර්ධන වියදම් රු.4,950,987 කින් ද, වැටුප්, වේතන හා සේවක ප්‍රතිලාභ රු.14,111,806 කින් වැඩි වී තිබුණ ද, රජයේ ප්‍රදාන රු.63,516,683 කින් වැඩි වීම මෙම ඌනතාවය අඩු වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2010 වර්ෂයේ රු.11,511,530 ක්වූ ඌනතාවය 2013 වර්ෂය වන විට රු.50,601,704 ක් දක්වා වැඩි වී 2014 වර්ෂය වන විට රු.48,715,500 ක් දක්වා අඩු වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් නැවත ගැලපීමේ දී 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා පදනමේ දායකත්වය පිළිවෙලින් රු.38,537,938, රු.37,117,620, රු.37,819,654, රු.57,143,900, රු.69,018,051 ක් වී තිබුණි. 2013 හා 2014 වර්ෂවල පදනමේ දායකත්වය වැඩිවීමට වැටුප් වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

4.1 කාර්යසාධනය
-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රාග්ධන වියදම් සඳහා රු.මිලියන 70 ක් ප්‍රතිපාදනය කර තිබුණද සමාලෝචිත වර්ෂය තුල ප්‍රාග්ධන වියදම් වශයෙන් රු.මිලියන 37 ක් පමණක් වැයකර තිබුණ අතර එම වියදම්වලට අදාල තොරතුරු කාර්යසාධන වාර්තාවට ඇතුළත් කර නොතිබුණි. තවද තොණ්ඩමන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ, තොණ්ඩමන් සංස්කෘතික මධ්‍යස්ථානයේ හා තොණ්ඩමන් ක්‍රීඩා සංකීර්ණයේ ප්‍රාග්ධන වියදම් සඳහා රු.මිලියන 29 ක් ප්‍රතිපාදනය කර තිබුණද ඒ සඳහා වූ කිසිදු කාර්යයක් ඉටුකර නොතිබුණි.

(ආ) ඉදිරිපත් කරන ලද කාර්යසාධන වාර්තාවට අනුව පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2006 වර්ෂයේ දී ආරම්භ කරන ලද ප්‍රජාශක්ති හා නවශක්ති ව්‍යාපෘතිය යටතේ එක් වසරකට ළමයින් හා තරුණයන් 50,000 කට තොරතුරු තාක්ෂණ පුහුණුව හා තරුණයින් 200 කට රැකියා අවස්ථා ලබාදීමට සැලසුම් කර තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේ සිසුන් 3,352 ක් තොරතුරු තාක්ෂණ පුහුණුව සඳහා ඇතුළත් වී තිබුණු අතර 2006 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා තොරතුරු තාක්ෂණ පුහුණුව සිසුන් 39,140 කට පමණක් ලබා දී තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේදී තරුණ තරුණියන් සඳහා ලබා දුන් රැකියා පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

(ii) සමාලෝචිත වර්ෂයේ දී ප්‍රාදේශීය ප්‍රජාශක්ති මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා රු.මිලියන 2 ක් වෙන්කර තිබුණ ද එම වර්ෂය තුල කිසිදු ප්‍රජාශක්ති මධ්‍යස්ථානයක් ඉදිකර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය සඳහා තරුණයින් 400 ක් කාලීන අවශ්‍යතාවය අනුව අදාල වෘත්තීන්හි පුහුණු කිරීම සඳහා තොණ්ඩමන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය වෙනුවෙන් රු.මිලියන 24 ක් වැය කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත් වර්ෂය තුල පාඨමාලා 12 ක් සඳහා තරුණයින් 340 ක් (සියයට 85) පමණක් ඇතුලත් කර ගැනීමට හැකි වී තිබුණු අතර ඉන් තරුණයින් 231 ක් පමණක් විභාගයට පෙනීසිට තිබුණි. ඒ අනුව තරුණයින් 109 ක් ( සියයට 32 ක් ) පාඨමාලා හැරගොස් තිබුණු බවට නිරීක්ෂණය විය. තවද සමාලෝචිත වර්ෂයතුල පුහුණුව සඳහා බඳවාගත් තරුණයින් ගණන පෙර වර්ෂය හා සැසඳීමේ දී සියයට 9 ක අඩුවීමක් ද නිරීක්ෂණය විය.

(iv) තොණ්ඩමන් සංස්කෘතික මධ්‍යස්ථානයෙහි වාර්ෂිකව ශිෂ්‍යයන් 240 ක් සඳහා සංස්කෘතික පාඨමාලා පැවැත්වීමට සැලසුම්කර තිබුණ ද කාර්යසාධන වාර්තාවට අනුව ශිෂ්‍යයන් 35 ක් සඳහා පමණක් එම පුහුණුවීම් ලබා දී තිබුණි.

(v) තොණ්ඩමන් ක්‍රීඩා සංකීර්ණයෙහි 2014 වර්ෂය තුල තරුණ තරුණියන් 1,000 ක් සඳහා ක්‍රීඩා පහසුකම් ලබා දීමට සැලසුම්කර තිබුණ ද කාර්යසාධන වාර්තාවට අනුව 2014 වර්ෂය තුල ක්‍රීඩා පහසුකම් ලබා ගැනීම සඳහා ලියාපදිංචිවී සිටියේ තරුණ තරුණියන් 110 දෙනෙකු පමණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පදනම විසින් පවත්වාගෙන යනු ලබන ප්‍රජාශක්ති මධ්‍යස්ථාන 42 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර තවත් ප්‍රජාශක්ති මධ්‍යස්ථාන 35 ක් ඉදිකිරීමට 2012 වර්ෂයේ දී ඉඩම් මැනුම් කටයුතු සිදුකිරීම සඳහා රු. 2,359,298 ක් වැය කර තිබුණද, 2016 වර්ෂය අවසානය දක්වාම එම ඉඩම් පදනම වෙත පවරා ගෙන නොතිබුණි.

(ආ) 2005 අංක 19 දරන සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම පනතේ 10(2) වගන්තිය යටතේ පදනමට පවරාදී ප්‍රාග්ධනිත කර තිබුණු ඉඩම් හා ගොඩනැගිලි සඳහා හිමිකම් ඔප්පු පිළියෙල කිරීම 2016 දෙසැම්බර් වන විටත් සිදුකර නොතිබුණි.

(ඇ) ප්‍රජාශක්ති ව්‍යාපෘතිය යටතේ තෝරාගත් ප්‍රදේශ කිහිපයක ක්ෂේත්‍ර සම්බන්ධීකරණ කටයුතු සඳහා 2009 වර්ෂයේ දී අමාත්‍යාංශය විසින් පදනම වෙත රු.20,484,000 ක් ලබා දී තිබුණි. පත්වීම් ලිපියක් හෝ නිශ්චිත කාර්ය පැවරුමක් නොමැතිව හා සත්‍ය වශයෙන් ඉටුකළ රාජකාරී පිළිබඳ තහවුරු කිරීමකින් තොරව ඒ වෙනුවෙන් නිලධාරීන් 90 දෙනෙකුට 2010 වර්ෂයේ සිට 2013 අප්‍රේල් දක්වා කාලපරිච්ඡේදය සඳහා එම මුදල ගෙවා තිබුණි.

ඉහත සඳහන් පරිදි ක්ෂේත්‍ර සම්බන්ධීකරණ කටයුතු සම්බන්ධයෙන් පැවති දුර්වල කළමනාකරණය හේතුවෙන් පදනමේ ව්‍යාපෘති කළමනාකරු හා ව්‍යාපෘති සම්බන්ධීකාරක විසින් 2011 අප්‍රේල් සිට 2013 අප්‍රේල් දක්වා කාලපරිච්ඡේදය සඳහා ව්‍යාජ ලේඛන ඉදිරිපත් කර කළමනාකරුගේ පෞද්ගලික බැංකු ගිණුමට සම්බන්ධීකාරක දීමනාවලින් රු.4,252,500 ක් වංචා සහගතව බැර කරගෙන තිබුණි. ඒ පිළිබඳ සිදුකරන ලද විමර්ෂණයකින් පසුව ඔවුන් විසින් ආපසු මුදල් ගෙවීමට එකඟ වී 2014 මැයි 25 වන දින වනවිට ඉන් රු.1,050,000 ක් ගෙවා තිබුණු අතර ඉතිරි රු.3,202,500 ක් වූ මුදල් 2016 වර්ෂය අවසානය දක්වාම අයකරගෙන නොතිබුණි.

තවද 2010 වර්ෂයේ ක්ෂේත්‍ර සම්බන්ධීකරණ කටයුතු භාරගත් දින සිට 2011 මාර්තු දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී ක්ෂේත්‍ර සම්බන්ධිකාරක දීමනා වශයෙන් ගෙවන ලද රු.5,265,000 ක් පෞද්ගලික බැංකු ගිණුම්වලට බැර කර තිබීමට අදාලව පදනම විසින් විමර්ෂණයක් පවත්වා නොතිබුණි.

(ඇ) දිගුකාලයක සිට රේඛීය අමාත්‍යාංශය විසින් පදනම වෙත ලබා දී තිබූ දැනට භාවිතයේ පවතින වාහන 04 ක් පදනමට පවරා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 නිෂ්ක්‍රීය වත්කම්

-------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට භාවිතයෙන් ඉවත් කරන ලද සම්පූර්ණයෙන් ක්ෂය වී තිබුණ පිරිවැය රු. 5,396,901 ක් වූ යතුරුපැදි 57 ක් විගණිත දිනය වූ 2016 නොවැම්බර් 30 දින දක්වාම විකිණීමට හෝ ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පදනම විසින් භාවිතා කරනු ලබන වාහනයක් 2014 නොවැම්බර් 03 දින සිට අලුත්වැඩියා කිරීම සඳහා පෞද්ගලික ගරාජයකට භාර දී ඇතත් විගණිත දිනය වූ 2016 නොවැම්බර් 30 දින දක්වාම වාහනය අලුත්වැඩියා නොකර ගරාජයේ නිෂ්කාර්යව පැවතුණු බව නිරීක්ෂණය විය.

(ඇ) ස්වයං රැකියා ණය ව්‍යාපෘතිය යටතේ (Self Employment Loan Project) ප්‍රජාශක්ති මධ්‍යස්ථානවලට ලබා දීම සඳහා 2014 දෙසැම්බර් 01 දින රු.4,048,000 කට මිල දී ගෙන තිබුණු සිමෙන්ති බ්ලොක්ගල් මැෂින් 44 ක් 2015 පෙබරවාරි 24 දින අධිකරණ නියෝගයක් හේතුවෙන් අදාල ප්‍රජාශක්ති මධ්‍යස්ථානවලට ලබා දීමට නොහැකිව විගණිත දිනය වූ 2016 නොවැම්බර් 30 දින වන විටත් නෝවුඩ් තොණ්ඩමන් ක්‍රීඩා සංකීර්ණයේ ගබඩා කර නිශ්කාර්යව පැවතුණු බවට නිරීක්ෂණය විය. තවද, පරිත්‍යාග වශයෙන් බෙදාදීම සඳහා ණය පදනම යටතේ 2014 දෙසැම්බර් 30 දින මිල දී ගෙන තිබුණු එකතුව රු.2,794,368 ක් වූ කෝවිල් සීනු, පිත්තල පූජා පහන්, කායවර්ධන උපකරණ සහ ක්‍රීඩා උපකරණ කට්ටල බෙදා දීමෙන් තොරව 2016 දෙසැම්බර් 30 දින වන විටත් එම ක්‍රීඩා සංකීර්ණයේම ගබඩා කර තිබුණි.

(ඇ) 2007, 2008 හා 2009 වර්ෂවලදී ප්‍රජාශක්ති ව්‍යාපෘතිය යටතේ ප්‍රජාශක්ති මධ්‍යස්ථාන 42 කට අන්තර්ජාල සේවා සැපයීම, ඒ සඳහා උපදේශන ගාස්තු ගෙවීම, V-SAT ඇන්ටනා උපකරණ කට්ටල 42 ක් මිල දී ගැනීම හා එම උපකරණ නඩත්තු හා අලුත්වැඩියා කිරීම සඳහා රු.131,404,288 ක් වැයකර තිබුණ ද 2014 මාර්තු 01 දින සිට අන්තර්ජාල සේවාව සැපයීම නවතා දැමීම හේතුවෙන් එම උපකරණ කට්ටල 42 විගණිත දිනය වූ 2016 වර්ෂය අවසානය දක්වා නිශ්ක්‍රීයව පැවතුණි. කෙසේ වුවද මෙම සේවාව නවතා දැමීම සඳහා වූ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය විගණනයට ඉදිරිපත් නොවීය.

(ඉ) මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් යටතේ දක්වා ඇති පිරිවැය රු. 398,999 ක් වූ සමරු පළඟනා තොගයක් දීර්ඝ කාලයක සිට අදාල පාර්ශවයන් වෙත නිකුත් නොකර නිශ්කාර්යව පැවතුණි.

## 4.4 ප්‍රසම්පාදන ක්‍රියාවලිය

සමාලෝචිත වර්ෂයේ අවස්ථා 17 ක දී එකතුව රු.71,945,921 ක් වටිනා කාය වර්ධන උපකරණ, පූජා භාණ්ඩ, ක්‍රීඩා භාණ්ඩ, රෝද පුටු, ඇඳන්, ලැප්ටොප් පරිගණක, සිමෙන්ති බ්ලොක් ගල් මැෂින්, සංගීත උපකරණ, ජෙනරේටර්, මෝටර් සයිකල් වැනි භාණ්ඩ සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය වානිජ විවිධ නීතිගත සංස්ථාවෙන් ණය පදනම මත ලබාගෙන තිබුණි. එම මිලදී ගැනීම් සඳහා පදනමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණු අතර 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ද අනුගමනය කර නොතිබුණි.

## 4.5 හඳුනාගත් පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රම්බොඩ සංස්කෘතික මධ්‍යස්ථානයේ ප්‍රයෝජනය සඳහා රු.5,810,000 ක් වටිනා මිට්ෂුබිසි ඩබල් කැබ් රථයක් රු. 1,000,000 ක මූලික ගෙවීමක් සහ ඉතිරි මුදල මාසික වාරික 60 කින් ගෙවීමේ පදනම මත කල්බදු ක්‍රමය යටතේ 2014 නොවැම්බර් 26 දින පෞද්ගලික සමාගමකින් මිල දී ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට මේ සඳහා කරන ලද මුළු ගෙවීම වූ රු. 1,070,290 ක මුදල අත්තිකාරම් යටතේ ගිණුම්වල දක්වා තිබුණු අතර ඉන් පසුව අදාල රේඛීය අමාත්‍යාංශය විසින් පදනමට මුදල් ලබා නොදීම හේතුවෙන් කිසිඳු කල්බදු වාරිකයක් ගෙවා නොතිබුණි. කල්බදුකරු විසින් වාහනය නැවත අත්පත් කරගෙන තිබූ අතර කල්බදුකරු විසින් 2015 නොවැම්බර් 30 දින වන විට වාහනයේ අයිතිය ද ඔහු වෙත පවරාගෙන තිබුණි. කෙසේ වෙතත් මෙම වාහනය මිල දී ගැනීම සඳහා 2010 දෙසැම්බර් 07 දිනැති අංක ඩීබී/ජීපීඑස්/130/9/2 දරන අයවැය චක්‍රලේඛ 150 හි විධිවිධාන අනුගමනය කර නොතිබුණු අතර අදාල රේඛීය අමාත්‍යාංශයේ හා මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ද ලබාගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී විදුලි බිලක් නිරවුල් කිරීම ප්‍රමාදවීම සහ සේවක භාරකාර අරමුදලට දායක මුදල් ප්‍රේෂණය කිරීම ප්‍රමාදවීම හේතුවෙන් පිළිවෙලින් රු.14,671 ක් සහ රු.101,747 ක අධිභාර ගෙවා තිබුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව ප්‍රධාන කාර්යාලයේ හා ව්‍යාපෘති 03 ක් සඳහා 2014 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 218 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 144 ක් වූයෙන් පුරප්පාඩු 74 ක් විය.

මේ සම්බන්ධයෙන් පහත සදහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තොණ්ඩමන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සඳහා කාර්ය මණ්ඩලය හා වැටුප් ප්‍රමාණ අනුමත කරගෙන නොතිබුණි.

(ආ) තොණ්ඩමන් ක්‍රීඩා සංකීර්ණ ව්‍යාපෘතිය සඳහා 2003 වර්ෂයේ දී තනතුරු 21 ක කාර්ය මණ්ඩලයක් අනුමත කර තිබුණ ද ඉන් තනතුරු 20 ක් සඳහා නිලධාරීන් පත්කර නොතිබීම හේතුවෙන් එම ව්‍යාපෘතියේ අරමුණු ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) 2013 වර්ෂයේ දී රු.150,000 ක වියදමක් දරා පිලියෙල කළ පදනමෙහි බඳවා ගැනීමේ පරිපාටිය 2016 වර්ෂය අවසානය වන විටත් අනුමත කරගෙන නොතිබුණි.

(ඇ) 2005 වර්ෂයේ සිට නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මුදල්) තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් නොකර වයස අවුරුදු 60 ඉක්ම වූ නිලධාරියෙකු කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවාගෙන තිබුණි.

(ඉ) තොණ්ඩමන් සංස්කෘතික මධ්‍යස්ථානය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කර තිබූ තනතුරු වලට අමතරව එක් ලිපිකරුවකු හා උපදේශකවරු 2 ක් ඇතුලුව තනතුරු 4ක් අනුමැතියකින් තොරව පත්කර තිබුණු අතර ඒ සඳහා වර්ෂය තුල වැටුප් වශයෙන් රු.1,732,336 ක් ගෙවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් පදනම විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 15ක් ප්‍රමාද වී 2016 සැප්තැම්බර් 14 දින ඉදිරිපත් කර තිබුණි.

### 5.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජූනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය ප්‍රකාරව පදනම ආරම්භකළ 2007 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 5.3 අභ්‍යන්තර විගණනය

2009 ජූනි 09 හා 2011 දෙසැම්බර් 23 දිනැති පිළිවෙලින් අංක DMA/2009(1) හා DMA/ADM/2011/1/26 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛ ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණු අතර අභ්‍යන්තර විගණක විසින් ගණකාධිකාරි තනතුරේද කාර්යයන් සිදු කර තිබුණි.

## 5.4 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පදනම විසින් පිළියෙල කරන ලද අයවැය ලේඛනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ආ) අයවැය ලේඛනයට අනුව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රු.130,000,000 ක් ඇස්තමේන්තුකර තිබුණද සත්‍ය වියදම රු.176,187,647 ක් වූයෙන් රු.46,187,647 ක් ඇස්තමේන්තුව ඉක්මවා වියදම් කර තිබුණි. ඇස්තමේන්තුවේ පුනරාවර්තන වියදම් සඳහා දක්වා ඇති වර්ගීකරණය මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වර්ගීකරණයට අනුකූලව පිළියෙල කර නොතිබීම හේතුවෙන් ඒ ඒ වැය විෂයයවල ප්‍රතිපාදන සහ සත්‍ය වියදම සැසඳීමට නොහැකි විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර පදනමේ සභාපතිවරයා වෙත යොමුකරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | කාර්ය මණ්ඩල පරිපාලනය | කාර්ය මණ්ඩලය පත් නොකිරීම හා බඳවාගැනීමේ කාර්යපරිපාටිය අනුමත කර නොගැනීම. |
| (ආ) | ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූල නොවීම. |
| (ඇ) | අයවැය පාලනය | ඇස්තමේන්තු ඉක්මවා වියදම් කිරීම හා අනුමැතියෙන් තොරව මිලදී ගැනීම . |
| (ඈ) | වත්කම් කළමනාකරණය | වත්කම් නිශ්කාර්යව පැවතීම . |
| (ඉ) | මූල්‍ය පාලනය | (i) ගෙවීම් වවුචර් මත හා අදාල ලියවිලි මත "ගෙවන ලදී" මුද්‍රාව යොදා නොතිබීම.<br>(ii) ගෙවීම් මුදල් පොතේ වගකිව යුතු නිලධාරියා විසින් අත්සන් කර නොතිබීම. |